**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2019**
-----------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍යා ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍යා වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍යා වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

----------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.365,974,993 ක්වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම (Revaluation) වෙනුවෙන් විශ්වවිද්‍යාල විසින් කමිටුවක් පත් කොට අදාල ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇත. අදාල වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කරමි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර වත්කමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හා 08 ට අනුකූලව අසම්භාව්‍ය බැරකම්, හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම් සහ මූල්‍ය නොවන හෙළිදරව් කිරීම් පිළිබඳ විස්තර හෙළිදරව් කළ යුතු වුවද මාසික හිලව් දීමනාව (MCA) ඇතුලත් පාරිතෝෂිත දීමනාව හා පාරිතෝෂිත ගෙවීමේ ප්‍රමාදය සඳහා වූ අධිභාර මුදල් ඉල්ලීම සම්බන්ධයෙන් විශ්‍රාමික නිළධාරිණියක් විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව 2019 සැප්තැම්බර් 04 දින පවරා ඇති නඩුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වෙමි. එහෙත් විශ්‍රාමික නිලධාරිනිය විසින් ඉල්ලුම් කරන ලද මාසික හිලව් දීමනාව (MCA) පාරිතෝෂික දීමනාව සමඟ ගෙවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 2019/05 ට අනුව හිමිකම් නොමැති බව දන්වමි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් වලට අදාල කාර්යාල උපකරණ සඳහා ඇස්තමේන්තුගත ජීව කාලය නිශ්චිතව දැක්වීමකින් තොරව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ වසර 03 සිට 05 ලෙස දක්වා තිබුණි. එබැවින් කාර්යාල උපකරණ සම්බන්ධයෙන් ක්ෂය ගණනය කිරීමේ නිවැරදිතාවය තහවුරු කිරීමට නොහැකි විය. | එකඟ වේ.<br><br>ගිණුම්කරණ සටහන් මගින් එක් එක් වත්කම් වර්ගයන් සඳහා ක්ෂය කිරීමේ කාල පරාසයන් වෙන් වෙන්ව දැක්වීමට ඉදිරියේදී කටයුතු කරමි. | කාර්යාල උපකරණ හා පරිගණක මෘදුකාංග සඳහා ජීව කාලය හඳුනාගෙන ඒ අනුව වාර්ෂික ක්ෂය ගැළපීම් කළ යුතුය.. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා ඇති පිරිවැය රු.4,130,626 ක්වූ පරිගණක මෘදුකාංග වලට අදාලව බලාපොරොත්තු වන අනාගත ආර්ථික ප්‍රතිලාභ කාලය හෝ ක්‍රමක්ෂය ප්‍රතිශතය ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ.<br>අස්පෘෂ්‍ය වත්කම් යටතේ දක්වා ඇති මෘදුකාංග වල ඵලදායී ජීව කාලය ගිණුම් සටහනක් මඟින් හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | අස්පෘශ්‍ය වත්කම් වලට අදාල ක්‍රමක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තා අනුව රසායන ද්‍රව්‍ය හා වීදුරු උපකරණ තොගයේ වටිනාකම රු.23,337,528 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.19,974,934 ක් ලෙස එනම් රු.3,362,594 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වේ.<br>තොග ශේෂයන් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල තොග අගය සමඟ සමීක්ෂණ වාර්තා අදාළ සටහන් සමඟ සසඳා නිවැරදි තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කළ යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන සංගතභාවය ආරක්ෂා වන පරිදි ඉදිරිපත් කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය තුල ඇතුලත් කර තිබූ විශේෂිත අරමුදල් ගිණුම් සමාලෝචිත වර්ෂයේ දී ඇතුලත් කිරීමකින් තොරව පිළියෙල කර තිබුණි. | 2019 වර්ෂය තුළදී සිදුකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සංශෝධනයේදී රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් ප්‍රදාන පිළිබඳ ප්‍රතිපත්ති වෙන වෙනම දක්වන ලදි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුල තොරතුරු ඉදිරිපත් කිරීමේ ගුණාත්මකභාවය ඉහළ දැමීම සඳහා හිමිකම් හා සංචිතත්, අරමුදල් සම්බන්ධ තොරතුරුත් ශේෂ පත්‍රයෙහි හිමිකම් හා සංචිත යටතේ වෙන් වෙන්ව ඉදිරිපත් කරන ලදි. | මූල්‍ය ප්‍රකාශන සංගතභාවයකින් ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.872,000 ක්වූ කෙටි කාලීන පාඨමාලා ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වේ. බාහිර පාඨමාලා සිසුන්ගේ අදායම් නියමිත පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ආදායම් හඳුනාගෙන නියමිත පරිදි ගිණුම්ගත කළ යුතු ය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගොඩනැගිලි හා සවිකිරීම් නඩත්තු තොගයේ වටිනාකම රු.1,199,787 ක් වුවද, එදිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව එම තොගයේ වටිනාකම රු.579,940 ක් වූයෙන් රු.619,847 ක වෙනසක් විය. | අදාල තොග ගිණුම් සැසඳුම (Stock Control A/C (01-010-26011) Reconciliation) මේ සමග ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශනවල අගයන් භෞතික සමීක්ෂණ වාර්තා සමඟ සසඳා නිවැරදි තොග අගය මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණි. | එකඟ වෙමි. මේ වන විට මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබද ලේඛනයක් පිළියෙළ කර පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි අනුව හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය. |
| (ii) | මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිමකළ විගස පියවිය යුතු වුවද, අවස්ථා 158 කදී දෙන ලද රු.5,557,142 ක අතුරු අග්‍රිම පියවීම මාස 01 සිට මාස 08 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | අදාළ කාර්යය නිමකළ වහාම අත්තිකාරම් පියවීමට උපදෙස් ලබා දී ඇති අතර නියමිත වේලාවේදී පියවා නොමැති අය සඳහා සිහිකැඳවීම් යැවීමට කටයුතු කර ඇත. | අතුරු අග්‍රිම ලබාදුන් කාර්යය නිම වූ වහාම, එම අග්‍රිම පියවීමට අවශ්‍ය පියවර ගත යුතු ය. |
| (iii) | මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 | තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීමේදී එම කාර්යයට අදාලව ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණ ද, ගෙවා තිබුණු අතුරු අග්‍රිම මුදල් වලින් සියයට 25 සිට සියයට 100 දක්වා ප්‍රමාණයක් ලෙසට අවස්ථා 222 කදී එකතුව වූ රු.2,401,166 ක් වියදම් නොකර ඉතිරි වී තිබුණි. | අවශ්‍ය වන මුදලට සරිලන ඇස්තමේන්තු සකසන ලෙස කාර්යය මණ්ඩලයට උපදෙස් ලබා දී ඇති අතර, ඉදිරියේදී නිවැරදි ඇස්තමේන්තු වලට අනුව මුදල් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොදිය යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 381 | උසස් අධ්‍යයන ව්‍යාප්ත කිරීමේ සහ සංවර්ධන කිරීමේ වැඩසටහන් කඩිනම් කිරීමේ ව්‍යාපෘතියේ ගනුදෙනු සඳහා (AHEAD Project) මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් 2018 අප්‍රේල් 25 දින ආරම්භ කර තිබුණි. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති Accelerating Higher Education Expansion and Develop (AHEAD) ව්‍යාපෘතිය සඳහා Operational and Monitoring Supporting Team (OMST) මඟින් 2018 අප්‍රේල් මස 16 වන දිනැති ලිපිය මඟින් දෙන ලද උපදෙස් පදනම් කර ගෙන බැංකු ගිණුම ආරම්භ කිරීම සිදු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වර්ෂ 02 ඉක්මවූ එකතුව රු.15,639,426 ක පොදු තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කර නොතිබුණි. | සැපයුම්කරුවන්ට අතරඳවුම් ශේෂය තහවුරු කිරීමේ ලිපි 2019 මැයි 27 දින යැවීමට කටයුතු කර ඇත. ප්‍රතිචාර දැක්වූ ලිපි සඳහා මුදල් නිදහස් කළ අතර ප්‍රතිචාරයක් නොදැක්වූ සැපයුම්කරුවන්ට අයත් වර්ෂ 2008 සිට 2016 දක්වා කාලයට අදාල රු.3,559,545 ක් ආදායමට ගැනීමට කටයුතු කර ඇත. මෙම තැන්පතු සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කිරීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි අනුව පොදු තැන්පතු නියාදනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (vi) | මුදල් රෙගුලාසි 880 | භාණ්ඩ හා මුදල් භාරව කටයුතු කරන සහ චෙක්පත් වලට අත්සන් කරනු ලබන නිළධාරීන්ගෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලබාගෙන නොතිබුණි. | චෙක්පත් අත්සන් කරන නිළධාරීන් සම්බන්ධයෙන් ඇප තැන්පතුවක් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතු ය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| | XXIV පරිච්ඡේදයේ 4.2.2, 4.5, 4.6 හා 6.3 වන වගන්ති | මියගිය හා සේවය අතහැර ගිය නිළධාරීන් 04 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.230,080 ක ආපදා සහ උත්සව අත්තිකාරම් ණය ශේෂ වසර 05 කට අධික කාලයක් ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | 1. මියගිය නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.163,500 ක ආපදා ණය ශේෂය ඇයගේ අර්ථසාධක අරමුදලින් අය කර ගැනීමට බලාපොරොත්තු වෙමි.<br>2. සේවයෙන් ඉවත්ව ගිය තවත් නිලධාරිනයකගේ රු.58,330 ක ආපදා ණය ශේෂය ඇයගෙන් අයකර ගත යුතු බැඳුම්කර උල්ලංගණ වටිනාකමට ඇතුලත් කර අය කර ගැනීමට කටයුතු කරමි.<br>3. තවත් නිලධාරියෙකුගෙන් | ආයතන සංග්‍රහයට අනුව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අයවිය යුතු උත්සව අත්තිකාරම් රු.4,500 ක මුදල අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි.<br><br>4. ඉල්ලා අස්වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් රු.3,750 ක් අර්ථසාධක අරමුදල ගෙවීමේදී අයකර ගැනීමට කටයුතු කරමි. | |
| **(ඇ)** | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය** | | | |
| (i) | X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය හා XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය | සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා හෝ ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කරගෙන හෝ නොතිබුණි. | විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා අත්සන් කිරීමේ ලේඛනයක් හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම සිදු නොවේ. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ii) | VII පරිච්ඡේදයේ 4.1 ඡේදය | 2017 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා නිලධාරීන් 390 දෙනෙකු වෙනුවෙන් ගෙවල් කුලී දීමනා වශයෙන් රු. 30,011,557 ක් ගෙවා තිබුණ ද, එම දීමනා ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විශ්ව විද්‍යාලය ස්ථාපනය කිරීම සඳහා වූ 2004 ඔක්තෝබර් 28 දිනැති කැබිනට් පත්‍රිකා අංක 2004/ED/HE/45 මගින් සිසුන් හා කාර්යමණ්ඩලයට සම්පූර්ණ නේවාසිකාගාර පහසුකම් සැපයිය යුතු බවට දක්වා ඇත. ඒ අනුව සිසුන්, අධ්‍යයන හා අනධ්‍යන කාර්යමණ්ඩල වැඩිවීමත් සමඟ බදු පදනම මත නිවාස ලබාදීමට නොහැකි විය. එබැවින් නවාතැන් පහසුකම් සඳහා දීමනාවක් ගෙවීමට නිවාස කමිටුව නිර්දේශ කළ අතර, එයට 155 වැනි පාලක සභා අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව 2017 | ගෙවල් කුලී දීමනා ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ජනවාරි 01 දින සිට මේ දක්වා නිවාස දීමනාව ගෙවනු ලබයි. | |
| (ඇ) | **2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | | | |
| | (i) | මාණ්ඩලික නිලධාරියෙකුට එක් වරකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද, එම සීමාව ඉක්මවා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුල නිළධාරීන් 04 දෙනෙකුට අවස්ථා 05 කදී රු.1,188,476 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | විශ්වවිද්‍යාලයට ආවේණික වූ විශේෂ මෙන්ම අත්‍යාවශ්‍ය කටයුතු සිදු කිරීමේදී රු.100,000 ඉක්මවා අත්තිකාරම් ගෙවීම් සිදු කොට ඇත. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| | (ii) | සුළු වියදම් සඳහා රු.25,000 ක උපරිමයක් දක්වා සුළු මුදල් අතුරු අග්‍රිමයක් තබා ගැනීම සඳහා අවසර දීමට ගණන් දීමේ නිළධාරියෙකුට හැකි වුවද, එම සීමාව ඉක්මවා 2019 ජනවාරි 01 දින සරප් වෙත රු.50,000 ක සුළු මුදල් අතුරු අග්‍රිමයක් ලබාදී තිබුණි. | යම් වවුචරයක් මඟින් මුදල් ගෙවීම සිදු කරන විට ඒ සඳහා චෙක්පත් නිකුත් නොකොට සරප් මඟින් ගෙවීම සඳහා සරප්වරයා වෙත මෙම රු.50,000 සුළු මුදල් අතුරු අග්‍රිමය ලබා දී ඇත. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| | (iii) | තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් ලබාදිය යුතු වුව ද ඊට අනුකූල නොවන ලෙසට මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 204 කදී එකතුව රු.4,394,459 ක අග්‍රිම ලබාදී තිබුණි. | මාණ්ඩලික නොවන නිලධාරීන් වන ස්ථිර සේවයේ නිරත ලිපිකරු හා සාමාන්තර ශ්‍රේණි තනතුරු සඳහා අත්තිකාරම් ගෙවීම් සිදු කොට ඇත. විශේෂිත කාර්යයන් කිහිපයක් සිදු කිරීමේදී මාණ්ඩලික නිළධාරීන් එකවර අත්තිකාරම් මුදල් කිහිපයක් ගෙවීම වැලැක්වීම සඳහා වේ. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඉ) | **1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය** | අධ්‍යයන නිවාඩු සඳහා විදේශගත වන ආචාර්යවරුන් විසින් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් අයකරනු ලබන සියලුම මුදල් පොළී ආදායම් උපයන වත්කම් වල | 2019 වර්ෂයේදී පුනරාවර්ථන ප්‍රතිපාදනයන් වලට අදාල මුදල් නිදහස් කිරීම් නියමිත පරිදි සිදු නොවූ අවස්ථා වලදී අත්‍යාවශ්‍ය හදිසි | අදාල චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ආයෝජනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.4,049,788 ක මුදලක් විශ්වවිද්‍යාලයේ ජංගම ගිණුමෙහි තැන්පත් කර තිබුණි. | පුනරාවර්ථන වියදම් සඳහා එම මුදල් යොදවා ඇති අතර නියමිත පරිදි අනුමත පුනරාවර්ථන ඇස්තමේන්තුවට අදාළ මුදල් නිදහස් වූ පසුව එම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරමි. | |
| (ඊ) | **2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය** | මුදල් අයෝජනය සඳහා මුදල් ඇමතිවරයාගේ එකඟතාවය ඇතිව උචිත ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශේෂිත අරමුදල් 05 ක පැවති එකතුව රු.23,542,190 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | ඉදිරියේ මෙම විශේෂිත අරමුදල් ආයෝජනය සම්බන්ධව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | අදාල චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (උ) | **1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය** | සිංහරාජ වනාන්තරයේ ගස්වල වර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ කටයුතු සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ පර්යේෂණ ආයතනයක් විසින් 2018 හා 2019 වර්ෂ සඳහා ලබාදී තිබුණු රු.19,289,996 ක විදේශ ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීමකින් තොරව සෘජුවම ලබාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 610 සහ 1994 අප්‍රේල් මස 20 දිනැති අංක 30/94 දරණ ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර මින් ඉදිරියට විදේශාධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සියළු විදේශ ආධාර හා ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඌ) | **2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය** | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.3,090,061,214 ක ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් පවත්වා තිබූ ස්ථාවර වත්කම් ලේඛනය චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලවී නොතිබුණි. එමෙන්ම දැනට භාවිතා කරන පරිගණක වැඩසටහනට 2013 වර්ෂයට පසුව මිලදී ගෙන ඇති ස්ථාවර වත්කම් වල තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | දැනට විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය 2020 මැයි මස 22 වෙන දින රජයේ විගණන කාර්යාලය වෙත ලබා දී ඇති අතර, පරිගණක ගත කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරියේ දී ලබා දීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් ලේඛනය හා පරිගණකගත කරන ලද වත්කම් පිළිබඳ වාර්තාව විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මෙහෙයුම් ප්‍රතිඵලය රු.174,635,769 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.168,999,621 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,636,148 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක වැටුප් හා වේතන වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීම සඳහා ලබා දී තිබුණු කර්මාන්ත අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 30.9667 ක ඉඩම, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 14 ක කාලයක් ගතවී තිබුණ ද, විශ්වවිද්‍යාලයට පවරා ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලයට ලබාදී තිබුණු හෙක්ටයාර් 30.9667 ක ඉඩම විශ්වවිද්‍යාලයට පැවරීම සඳහා බාධකයක්ව තිබූ එහි තාවකාලික පදිංචි කර්මාන්ත කරුවන් ඉවත් කිරීම සඳහා අ.ම.ප/19/0379/110/020 කැබිනට් පත්‍රිකාව යටතේ පත්කරණ ලද වන්දි කමිටුව මගින් එකී ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර ඇත. | ඉඩමේ අයිතිය විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට අදාල කටයුතු කඩිනමින් කළ යුතු ය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ ඇණවුම් කිරීමේදී හා මිලදී ගැනීමේ දී අවශ්‍යතාවය හා ගබඩාවේ පවතින තොග මට්ටම් කෙරෙහි අවධානය යොමු නොකර පහත සඳහන් භාණ්ඩ මිලදී ගෙන තිබුණි. | | |
| | 2015 මැයි 21 දින හා 2015 සැප්තැම්බර් 11 දින මිලදී ගෙන තිබුණු රු.354,200 ක් වටිනා A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි පැකට් 385 ක් වසර 05 ක කාලයක් උපයෝජනය නොකර ගබඩා කර තිබුණි. | විගණිත දිනය වූ 2020 මැයි මස 19 වන දින පැවති A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි පැකට් 385 න් 2020 ජූනි මස 24 දින වන විට පැකට් 50 ක් උපයෝනය කර ඇති අතර ඉතිරිය විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා අනුව උපයෝජනය කිරීමට කටයුතු කරමි. | අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් සිදු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අපජලය පිරිපහදු පද්ධතිය මගින් පිරිසිදු කරගත් ජලය වාහන සේදීම හා අනෙකුත් විවිධ නඩත්තු කටයුතු සඳහා උපයෝජනය කර නොගැනීම නිසා විශ්වවිද්‍යාලය ඉකුත් වර්ෂ 04 ක ජල පරිභෝජනය වෙනුවෙන් රු.22,313,316 ක් වැයකර තිබුණි. | බැහැර කරන අපජලය පිරිසිදු කර නැවත භාවිතයට ගැනීම, වැසි ජලය භාවිතා කිරීම හා භූමියේ ඇති අනෙකුත් උල්පත් ජලය භාවිතා කිරීමට මේ වනවිට උපදේශක සේවා සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) පත්කර ඇත. එසේම ඔවුන් මේ වන විට ටෙන්ඩර් ලිපි ගොනුව සකසා ඇත. ඒ අනුව ටෙන්ඩර් ක්‍රියාවලියට අනුව උක්ත ජල පහසුකම් ලබා ගැනීමට කටයුතු කර ඇත. | ජල පරිභෝජන වියදම අවම කර ගැනීම සඳහා අපජලය පිරිපහදු කර භාවිතයට ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 ජුලි 01 දිනට ශේෂය රු.1,080,448 ක්වූ අරමුදල් ගිණුම් 08 ක මුදල් උපයෝජනය සම්බන්ධයෙන් විධි විධාන සකස් කර නොතිබුණු අතර මෙම අරමුදල් වසර 02 සිට වසර 12 ක් දක්වා කාල පරාසයක් තුල ජංගම බැංකු ගිණුම් වල තැන්පත් කර තිබුණි. ඉන් අරමුදල් 06 කට අදාලව ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. | අදාල අරමුදල් ඵලදායි ලෙස ආයෝජනය කිරීමට කටයුතු කරන අතර විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සියලුම අරමුදල් වෙනුවෙන් වෙන වෙනම ලිපිගොනු පවත්වාගෙන යාමට කටයුතු කරමි. | අදාල අරමුදල් එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කළ යුතු ය. |
| (ආ) | විශ්වවිද්‍යාලය විසින් 2007 වර්ෂයේ සිට පවත්වාගෙන යන විශේෂිත අරමුදල් 10 කට අදාළව රු.1,211,071 ක් ආයෝජනය නොකර ජංගම ගිණුම්වල පැවතුණි. | විධිමත් මෙහෙයුම් විධිවිධාන ස්ථාපනය කොට උපරිම ඵලදායිතාවක් ලැබෙන සේ අදාල අරමුදල් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වෙමි. | අදාල අරමුදල් උපරිම ඵලදායීතාවයක් ලැබෙන පරිදි උපයෝජනය කළ යුතු ය. |

## 3.4 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2019 ජුනි 29 වෙනි දින නිම කිරීමට නියමිතව තිබුණු තාක්ෂණික අධ්‍යයන පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද වැඩ අවසන් කර නොතිබුණි. එමෙන්ම එම ගොඩනැගිල්ලේ පහළ මාලයේ (Basement) ඉදිකර ඇති වැඩ අවසන් නොකළ විද්‍යාගාරය වෙනුවෙන් මිලදීගත් රු.7,035,190 ක විද්‍යාගාර | තාක්ෂණික පීඨ ගොඩනැගිල්ලේ මුල් ඉදිකිරීම් කාල සීමාව දීර්ඝ කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් 2019.12.31 දින දක්වා දින 195 ක කාලයක් පමණක් ලබා දෙන ලදී.<br><br>තාක්ෂණික අධ්‍යයන පීඨයේ බිම් මහල හා පහත මහල (Ground | නියමිත කාල වකවානු තුළ ගිවිසුම් ප්‍රකාරව ඉදිරිකිරීම් කටයුතු නිම කිරීම් සිදුකර ගැනීමට කටයුතු කළයුතු අතර, උපකරණ ඵලදායීව භාවිතයට ගැනීමට හැකිවන |

| | | | |
|---|---|---|---|
| | උපකරණ 06 ක් වර්ෂයකට වැඩි කාලයක් නිෂ්කාර්යව ගබඩා කර තිබුණු අතර, ඉන් රු.3,096,490 ක උපකරණ 04 ක වගකීම් කාලය ද ඉක්මවා ගොස් තිබුණි. | floor and Basement) 2020 ජනවාරි මස අවසානයේ ලබා දෙන බවට 06.12.2019 දින පැවති 7 වන ඉදිකිරීම් පිළිබඳ 07 වන ප්‍රගති සමාලෝචන කමිටුවේ දී අදාල ආයතනය එකඟ වූ බැවින් මෙම විද්‍යාගාර භාණ්ඩ මිලදී ගන්නා ලදී. | ලෙසට මිලදී ගැනීම් සිදුකළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මගින් රු.2,657,499 ක් වැය කර ශිෂ්‍ය ඉගැනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු ට්‍රැක්ටර් රථ 2 ක් ඇතුළු කෘෂි උපාංග සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 03 ක කාලයක් ගතවී තිබුණද අදාල අරමුණ ඉටු කරගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | 2020 වසරේදී ආරම්භ වන පළමු සමාසිකයේ සිට උපයෝගි කර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත.<br>තවද රෝද 4 ට්‍රැක්ටර් රථය විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු වලට යොදවා ගැනීම සිදු වේ. | අදාල වත්කම් ඵලදායීව උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලයේ හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පිළිවෙලින් පුරප්පාඩු 43 ක් හා 68 ක් පැවතුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත තාවකාලික අධ්‍යයන කාර්යමණ්ඩලය හා තථ්‍ය තාවකාලික අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිවෙලින් 96 ක් හා 73 ක්වූ බැවින්, පුරප්පාඩු 23 ක් පැවතුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය හා ව්‍යවහාරික විද්‍යා පීඨයේ තනතුරු පුවත්පත් දැන්වීම් පළකොට ඇති අතර, ඊට අදාල පටිපාටියට අනුව කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.<br><br>කළමනාකරණ පීඨයේ පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කර ඊට අයදුම්පත් ලැබී ඇත. ඉදිරියේ දී ඊට අදාල වන සම්මුඛ පරීක්ෂණ පැවත්වීමට කටයුතු කරනු ලබයි.<br><br>තාක්ෂණික අධ්‍යයන පීඨයේ පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීමෙන් සම්මුඛ පරීක්ෂණ පවත්වා එක් ආචාර්යවරයෙක් බඳවාගැනීමට කටයුතු කර ඇති අතර, නැවත පුවත්පත් දැන්වීමක් පලකර ඇති අතර, ඊට අදාල අයදුම්පත් මේ වන විට ලැබී ඇත. ඉදිරියේ දී සම්මුඛ පරීක්ෂණ පැවත්වීමට කටයුතු කරනු ඇත.<br><br>පීඨයන් සඳහා වන තාවකාලික ප්‍රදර්ශක තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකරනුයේ එක් එක් පීඨයන්හි කාලින අවශ්‍යතාවය මත | අදාල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | බැවින් එකී පුරප්පාඩු පිරවීම සිදුවන්නේ අදාල පීඨයන්හි අධ්‍යයාංශ ප්‍රධානින්, පීඨාධිපතිවරු මඟින් සිදුකරන්නා වූ ඉල්ලීම් මත වේ.<br><br>පරිපාලන කාර්ය මණ්ඩලවල බොහෝ පුරප්පාඩු පිරවීම සිදුකරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟිනි. විශ්වවිද්‍යාලය මඟින් බඳවා ගැනීම් සිදුකරන කාර්ය මණ්ඩල සඳහා පුවත්පත් දැන්වීම් පළකොට ඇත. | |
| (ආ) | බඳවාගෙන වසර 03 ක් ඉක්මවා තිබුණ ද අධ්‍යාපන සුදුසුකම් සනාථ කර නොගත් හා විභාග දෙපාර්තමේන්තුව විසින් අ.පො.ස. (උ.පෙළ) අසමත් බවට සඳහන් පුහුණු තාක්ෂණික නිළධාරිණියක් සම්බන්ධයෙන් බඳවාගත් දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.2,343,438 ක්ද, විදේශ පුහුණු අවස්ථා 02 ක් සඳහා රු.345,017 ක්ද වැය කර තිබුණි. | ඇයගේ අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලීමක් සිදුකරන ලදී. එකී ලිපියට පිළිතුරක් ලෙස 2020.06.16 දිනැති අංක 11/18/UN/2606 දරන ලිපිය මගින් ඇය ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ විභාගයට පෙනී සිට භෞතික විද්‍යා හා ජීව විද්‍යාව විෂයන් සමත්ව ඇති බවත් රසායන විද්‍යා විෂය අසමත් බවත් විභාග දෙපාර්තමේන්තුවෙන් දන්වා එවා ඇත.<br><br>තවද උප කුලපතිගේ අනුමැතිය සහිතව මෙම සාමාර්ථ අතර විෂමතාවය පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය බව 2020.09.09 වන දින ලිපියක් මගින් අදාල නිළධාරිණියට දන්වා ඇති අතර සැප්තැම්බර් මස පැවැත්වීමට නියමිත පාලක සභාව වෙත මෙම කරුණු පිළිබඳ වාර්තා කොට ඇත. | තනතුරට අදාළ විභාග ප්‍රතිඵල එම ආයතනවලින් සනාථ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-------------------------------------**

**තිරසාර සංවර්ධන අරමුණු**

**----------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කළ යුතුවේ. එහෙත් එම චක්‍රලේඛයට අනුව විශ්ව විද්‍යාලයට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම සහ එම ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීමට අදාල කටයුතු සිදුකර නොතිබුණි. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්මෙහි මූලික අරමුණු 07 හි උප ප්‍රතිපත්ති ඇතුලත් කොට ඇති අතර එය වෙන්ව සඳහන් කොට නොමැත. එසේම තිරසාර සංවර්ධන අරමුණු ද වෙන්කර දක්වා නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක 2030 "න්‍යාය පත්‍රය" අනුව ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍ය ඉලක්ක හඳුනාගෙන ඊට අදාල කාර්යසාධන දර්ශක ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතු ය. |